Weekly school Department of Education, Sabaragamuwa Province/ Weekly school Department of Education, Sabaragamuwa Province/ Weekly school Department of Education, Sabaragamuwa Province/ Weekly school Department of Education, Sabaragamuwa Province/ Weekly school Department of Education, Sabaragamuwa Province/ Weekly school Department of Education, Sabaragamuwa Province/ Weekly school Department of Education, Sabaragamuwa Province/

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල

විෂය - පෙරදිග සංගීතය

සතිය - 11 වන සතිය

ශ්‍රේණිය - 07

සැකසුම - අචලා දිසානායක මිය
ර/බළ/ආනන්ද මෛත්‍රෙය මධ්‍ය මහා විද්‍යාලය

## පාඩම :- නූර්ති ගීත ගායනය.



- නූර්ති නාට්‍ය යනු,

- නාට්‍ය විශේෂයකි.
- හින්දුස්ථානි සංගීතයේ ආභාෂය ලබා ඇත.
- 1880 දී පමණ ලංකාවට පැමිණීම.
- සී දොන් බස්තියන් මහතා විසින් ප්‍රථම නූර්තිය ලංකාවේ එළිදැක්වීම.
- පසුකාලීනව නීතිඥ ජෝන් ද සිල්වා මහතා හා චාල්ස් ඩයස් මහතා නූර්ති නාට්‍ය විශාල ප්‍රමාණයක් නිර්මාණය කිරීම.
- නූර්ති නාට්‍ය කිහිපයක් ලෙස සිරිසඟබෝ, රාමායණය, පද්මාවතී, හේමමාලි නිදසුන් වේ.
- සංගීත භාණ්ඩ ලෙස සර්පිනාව, වයලීනය, තබ්ලාව, බටනළාව යොදා ගැනීම.

පහත නූර්ති ගීතය හොඳින් බලන්න.

නුර්තිය - ශ්‍රී වික්‍රම රාජසිංහ නාට්‍ය- නිෂ්පාදක - නීතිඥ ජෝන් ද සිල්වා

දන්න වංහුං අප කන්නසාමි රාජධූරයේ//- රාජධූර - රාජධූර - රාජධූරයේ
දන්න වංහුං අප කන්නසාමි රාජධූරයේ

රකී බුද්ධ ධර්ම ශීල පූර්වේ රජුන් ලෙසේ-අධර්මිෂ්ඨ නිච ක්‍රියා යයි මැකී ලකේ
යයි මැකී යයි මැකී යයි මැකී ලකේ

දනී සිංහළුන්ගෙ ශාස්ත්‍ර ආගම් මනා ලෙසේ-ඉතින් ප්‍රීතියෙන් ම යමවූ ජිතුමා වෙතේ
ජිතුමා ජිතුමා ජිතුමා වෙතේ

දන්න වංහුං C Major $\frac{6}{8}$

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ස්ථායි | | | | | | | | |
| ස-නි | ස-ග | -ගම | ප-ම් | ප-ග | ම-ධ | ප-ම | ග-රි | ස-නි |
| | ස-ග | -ගම | ප-ම් | ප-ග | ම-ධ | ප-ම | ග-- | -- |
| | ප-ස | නි-ස | ධ-නි | ප-ධ | ම-ධ | ප-ම | ග-රි | ස-නි |
| | ස-ග | -ගම | ප-ම් | ප-ග | ම-ප | ප-ම | ග-- | --- |
| අන්තරා | සස- | ගගම් | ප-ම් | ප-ප | ප-නි | නි-ස | ධනිධ | ප-- |
| | පනිනි | නිනිනි | ධ-නි | ස-රි | නිසනි | ධනිධ | ප-- | --- |
| | ප-ස | නි-- | ප-නි | ධ-- | ම-ධ | ප-ම | ග-රි | ස-නි |

ගීතයේ තුන්වැනි කොටස දෙවැනි කොටසේ නාද මාලාවටම ගැයේ

<u>පැවරුම</u>

1. ඉහත ගීතය අන්තර්ජාලය ඔස්සේ ශ්‍රවණය කරන්න.
2. ස්වර ප්‍රස්තාරය වාදනයට උත්සාය කරන්න.
3. පහත ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

i. දන්න වංහුං ගීතය ...................................... නාට්‍යයේ අන්තර්ගතය.

ii. එය ...................................... මහතා විසින් නිෂ්පාදනය කර ඇත.

iii. නූර්ති නාට්‍ය සඳහා ...................................... සංගීතයේ අභාෂය ලබා ඇත.

iv. ...................................... නූර්ති නාට්‍ය වල ප්‍රධාන තාල වාද්‍ය භාණ්ඩය වේ.

v. ඔබ උගත් නූර්ති ගීත 03ක් නම් කරන්න.

- ✓ ..................................
- ✓ ..................................
- ✓ ..................................